# සි/ස රත්නපුර දිස්ත්‍රික් සමූපකාර මණ්ඩලය - රත්නපුර

## පුරප්පාඩු තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම.

සී/ස රත්නපුර දිස්ත්‍රික් සමූපකාර මණ්ඩලයේ E3.1 විධායක ශ්‍රේණියේ ලේකම් තනතුර සඳහා රත්නපුර දිස්ත්‍රික්කය තුල වසර 02ක ස්ථිර පදිංචි පහත සුදුසුකම් සපුරා ඇති අයගෙන් 2020 නොවැම්බර් 25 දින දක්වා මා විසින් අයදුම්පත් කැදවනු ලැබේ.

**තනතුර :- E3.1 විධායක ශ්‍රේණිය - දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල ලේකම් III වන පන්තිය**

**සුදුසුකම් -:**

I. පිළිගත් විශ්ව විද්‍යාලයක මානව සම්පත්/පරිපාලන/පිරිස් කළමනාකරණ /සංඛ්‍යා ලේඛණ පිළිබඳ උපාධිය සමඟ පිළිගත් වාණිජ /කාර්මික ආයතනයක වසරක පළපුරුද්ද තිබීම.

**හෝ**

II. පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ හෝ ඊට සමාන ඩිප්ලෝමා සහතිකය සමඟ පිළගත් වාණිජ / කාර්මික ආයතනයක වසර 03 ක පළපුරුද්ද තිබිම.

**හෝ**

III. ශ්‍රී ලංකා ජාතික සමූපකාර මණ්ඩලයේ කළමනාකරණය පිළිබඳ ජාතික සහතික පත්‍ර (උසස් පෙළ) සහතිකය සමඟ පිළිගත් වාණිජ /කාර්මික ආයතනයක විධායක මට්ටමේ තනතුරක වසර 03 ක සතුටුදායක සේවා පළපුරුද්ද තිබීම.

**හෝ**

IV. සබරගමුව විශ්ව විද්‍යාලයේ සමූපකාර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව ලබා තිබීම සහ පිළිගත් වාණිජ /කාර්මික ආයතනයක විධායක තනතුරක වසර 03 ක හෝ මෙහෙයුම් 1 මට්ටමේ තනතුරක වසර 08 ක හෝ මෙහෙයුම් 11 මට්ටමේ තනතුරක වසර 10 ක හෝ සතුටුදායක සේවා කාලයක් තිබීම.

**හෝ**

V. අ.පො.ස. උසස් පෙල සමත්වීම සමඟ පිළිගත් වාණිජ /කාර්මික ආයතනයක මෙහෙයුම් ශ්‍රේණියේ තනතුරක වසර 15 ක පළපුරුද්ද තිබීම.

**වැටුප :-** රු.22,800-10x190-10x210-26,800
(මෙයට අමතරව අය වැය සහන දීමනාව රු. 7200/= ක් එකතු කර ගෙවනු ලැබේ)

**වයස :-** අවු 18 ත් 45 ත් අතර (සබරගමුව පළාතේ සමූපකාර සමිතිවල සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

**ඇපය :-** මූලික වැටුප මෙන් පස් ගුණයකි.

සමූපකාර සමිතියක දැනට සේවය කරන අයගේ අයදුම්පත් අදාල සමිතිය මගින් ඉදිරිපත් කළ යුතුය.

නියමිත සුදුසුකම් ඇති අයදුම්කරුවන් පහත සඳහන් සහතික වල පිටපත් ද සමඟ තමන් විසින් පිළියෙල කරගත් අයදුම්පත් **"ගරු සභාපතිතුමා, සී/ස රත්නපුර දිස්ත්‍රික් සමූපකාර මණ්ඩලය, අංක 28, බණ්ඩාරනායක මාවත, රත්නපුර"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම් පස කෙලවරේ **"ලේකම්, තනතුර III පන්තිය"** යනුවෙන් සඳහන් කළ යුතුය.

**සුදුසුකම් සනාථ කිරීම සඳහා**

01. අධ්‍යාපන සහතික වල පිටපත් / 02. උප්පැන්න සහතිකයේ පිටපතක් / 03. ග්‍රාම නිලධාරී වාර්තාව / 04. වෙනත් සහතිකවල පිටපත් / 05. ජාතික හැඳුනුම්පතෙහි පිටපත් / 06. පළපුරුද්ද පිලිබඳ සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත වන අතර සේවක අර්ථ සාධක අරමුදලටද හිමිකම් ලබයි. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබයි.

**මෙයට - සමූපකාරික,**

**ජේ.එම්. නන්ද ජයසිංහ**
**ගරු සභාපති**